**විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහයවීමේ ව්‍යාපෘතිය (ලංකා විදුලිබල මණ්ඩලය-ආසියානු සංවර්ධන බැංකුව - ගිවිසුම් අංක 3409 - SRI) - 2024**

---

විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහයවීමේ ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක 3409 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විදුලිබලය සැපයීමේ සහ බෙදාහැරීමේ පද්ධතිවල කාර්යක්ෂමතාව සහ විශ්වසනීය බව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 24,228.15 කට සමාන වූ එජඩො මිලියන 160.20 වන අතර ඉන් රු. මිලියන 17,392.24 කට සමාන වූ එජඩො මිලියන 115 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව ආරම්භයේදී එකඟ වී තිබුණි. කෙසේවෙතත්, එය රු. මිලියන 13,611.31 කට සමාන එ.ජ.ඩො මිලියන 90 දක්වා සංශෝධනය කර තිබුණි. ඉතිරි මුදල රු.මිලියන 6,836 කට සමාන වූ එජඩො මිලියන 45.2 ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජූනි 29 දින ආරම්භ කරන ලද අතර, 2022 මාර්තු 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපාතියේ කටයුතු අවසන් කරන දිනය 2026 මාර්තු 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

විදුලිබල සැපයුමේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහයවීමේ ව්‍යාපෘතිය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද පැකේජ 08 න් සමාලෝචිත වර්ෂය තුළ 04, 07 සහ 11 යන පැකේජවල කටයුතු සිදු කර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| | **පැකේජ 04** | | |
| (අ) | කිලෝමීටර් 285 ක දිගකින් යුත් කිලෝවොට් 33ක කුළුණු මාර්ග සහ කිලෝවොට් 33 ක ගැන්ට්‍රි 13ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව එ.ජ.ඩො 23,291,732 + රු. 3,025,335,717 ආසන්න වශයෙන් රු. මිලියන 6,782 ක පිරිවැයකට 2019 මැයි 30 වන දින ප්‍රදානය කරන ලද අතර 2021 ඔක්තෝබර් 27 දින වනවිට දින 730 ක් ඇතුළත නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, 2025 මාර්තු 31 දක්වා අවස්ථා 04 කදී දින 1251 කින් කාලය දීර්ඝ කිරීම ලබා දී ඇති අතර ව්‍යාපෘතිය විසින් තවදුරටත් දීර්ඝ කිරීමට කටයුතු කරමින් පැවතුණි. ඒ අනුව, කාලය දීර්ඝ කිරීම ආරම්භක ඉදිකිරීම් කාලය මෙන් 02 ගුණයකට වඩා වැඩි වී තිබුණි. ඉහත පරිදි කොන්ත්‍රාත්කරුට කාල දිර්ඝ කිරීම් ලබා දී තිබුණද, 2024 දෙසැම්බර් 31 වන විට මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් 70.5% සහ 73.8% ක් විය. මෙම අධික කාල දිගු කිරීම් හේතුවෙන්, මධ්‍යම වෝල්ටීයතා ජාලයේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම, ග්‍රාමීය විදුලිබල ජාලය පුළුල් කිරීම සහ පුනර්ජනනීය යෙදවුම් අවශෝෂණය කිරීම යන ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | ඉදිකිරීම් ප්‍රමාද වීමට ප්‍රධාන හේතු වූයේ කොවිඩ් වසංගතය, ශ්‍රී ලංකාවේ මූල්‍ය අස්ථාවරත්වය, කොන්ත්‍රාත් ආරවුල් වේ. දීර්ඝ කරන ලද කාල සීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂා කෙරේ. | පුළුල් අධීක්ෂණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 වන දිනට ප්‍රගති වාර්තාවට අනුව, කිලෝමීටර 285 දිගින් යුතු කුළුණු මාර්ග 16කින්, මහෝ ග්‍රිඩ් උපපොළේ සිට මාළිය ගැන්ට්‍රි දක්වා සහ අම්පාර ග්‍රිඩ් උපපොළේ සිට උහන ගැන්ට්‍රි දක්වා කිලෝමීටර 38.2කින් යුතු මාර්ග 02ක් | කුළුණු මාර්ගය යකාබැද්ද ගැන්ට්‍රි සිට වැලිගම ග්‍රිඩ් උපපොළ දක්වා වෙනස් කරන ලදී. (අලුතින් යෝජනා කරන ලදී). | නිසි අධීක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පමණක් සියයට සියයක වැඩ නිම කර ඇති අතර 2024 දෙසැම්බර් 31 වන විට කිලෝමීටර 21ක දිගින් යුතු මාතර ග්‍රිඩ් උපපොළේ සිට යකබැද්ද දක්වා මාර්ගයේ වැඩ කටයුතු ආරම්භ කර නොතිබුණි. | | |
| (ඇ) | ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට අපේක්ෂිත ගැන්ට්‍රි 13න්, වර්ෂය අවසානයේදී කිසිදු ගැන්ට්‍රියක වැඩ අවසන් කර නොතිබූ අතර, ගැන්ට්‍රි 07ක් සියයට 25 ත් සියයට 50 ත් අතර සම්පූර්ණ කර පැවතුනි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයේ දී වරුකන්දෙණිය ගැන්ට්‍රියේ කිසිදු වැඩක් ආරම්භ කර නොතිබුණි. | කම්බි සවිකිරීමේ උපකරණ නොමැතිකම නිසා කම්බි සවිකිරීමේ ප්‍රගතිය සියයට 38 ක් පමණ වේ. ඉලක්ක සපුරා ගැනීම සඳහා යන්ත්‍ර ගණන වැඩි කරන බව කොන්ත්‍රාත්කරු දැනුම් දී ඇත. | පුළුල් අධීක්ෂණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| බියගම ග්‍රිඩ් උපපොළේ Static Var පද්ධතිය ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුවේ අත්තිකාරම් ගෙවීමට අදාළ ගෙවීම් කොන්දේසි බී1ට අනුව, වැඩ නිමකිරීමේ සහතිකය නිකුත් කිරීමට පෙර හෝ අවසන් කිරීමට පෙර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් ආපසු ගෙවා නොමැති නම්, එම හිඟ මුළු ශේෂයම කොන්ත්‍රාත්කරු විසින් සේවායෝජකයාට වහාම ගෙවිය යුතුය. කෙසේවෙතත්, එම විධිවිධානයට පටහැනිව වැඩ නිමකිරීමේ සහතිකය නිකුත් කරන අවස්ථාවේදී නිදහස් කරන රඳවා ගැනීමේ මුදලින් (වෙනත් අරමුණක් සඳහා රඳවාගෙන ඇති) රු. 240,000ක් සහ රු. 884,951 කට සමාන එ.ජ.ඩො 4,695.20 ක අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගෙන තිබුණි. | කොන්ත්‍රාත්තුවේ භාවිතයට නොගත් අයිතම හේතුවෙන් අත්තිකාරම් මුදල් ව්‍යාපෘතිය අවසන් වන විට ඉතිරිව තිබේ. එබැවින්, භාවිතයට නොගත් මුදල (ණය ඉතිරි කිරීම) හේතුවෙන් ඉතිරිව ඇති අත්තිකාරම් මුදල, ව්‍යාපෘතිය අවසන් වන විට නිකුත් කරන වැඩ නිමකිරීමේ සහතිකයේ නිකුත් කරන අවස්ථාවේ නිදහස් කරන රඳවා ගැනීමේ මුදලින් අයකර ගනු ලැබේ. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූල වීමට පියවර ගත යුතුය. |

## 2.3 අරමුදල් උපයෝජනය

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ආසියානු සංවර්ධන බැංකුව විසින් වෙන් කරන ලද එ.ජ.ඩො මිලියන 90ක මුදලින්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ වී වර්ෂ 08ක් ගතවීමෙන් | 2026 මාර්තු 31 වන දින දක්වා තවත් මාස 15 ක් ඉතිරිව ඇති අතර, ණය කාලය | ණය මුදල ඵලදායී ලෙස භාවිත කරමින් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය කඩිනම් |

| | | | |
|---|---|---|---|
| | පසු සියයට 79ක් නියෝජනය කරන රු. මිලියන 17,315.02කට සමාන එ.ජ.ඩො මිලියන 71.34ක් සමාලෝචිත වර්ෂය අවසානයේදී භාවිත කර තිබුණි. එබැවින්, 2026 මාර්තු 31 දින ණය අවසන් වීමට පෙර තවදුරටත් එ.ජ.ඩො මිලියන 18.65 ක් ලබාගැනීමට අවශ්‍ය වේ. | අවසන් වීමට පෙර වෙන් කරන ලද අරමුදල් සම්පූර්ණයෙන්ම භාවිත කිරීම ව්‍යාපෘති කළමණාකරණ ඒකකයේ අරමුණ වේ. | කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | රු. මිලියන 17,315.02 කට සමාන එ.ජ.ඩො 71,344,591කින් 2023 සැප්තැම්බර් 20 සිට 2024 දෙසැම්බර් 11 දක්වා විශේෂ විදේශ මුදල් බැංකු ගිණුම හරහා ගෙවන ලද රු. මිලියන 1,275.12කට සමාන එ.ජ.ඩො මිලියන 4.17ක මුදලක් ආසියානු සංවර්ධන බැංකු ණය මුදලින් පියවීමට පියවර නොගෙන ගෙවන ලද නමුත් හිමිකම් පෑමක් කර නොමැති ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ආසියානු සංවර්ධන බැංකුව වෙතින් දේශීය නියෝජිතයින්ගේ කොන්ත්‍රාත් අංක (PCSS අංකය) ලැබුණු පසු ආසියානු සංවර්ධන බැංකුව වෙතින් පියවීමට පියවර ගෙන ඇත. | ණය අරමුදල් ඵලදායී ලෙස භාවිත කළ යුතුය. |
| (ඇ) | ණය මුදල වෙන් කිරීම අනුව, පොලී සහ බැඳීම් ගාස්තු සඳහා එ.ජ.ඩො මිලියන 6.3 ක මුදලක් වෙන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට සියලුම ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම භාවිත කර තිබුණි. ඉන් ණය මුදල් වියපහැදම් කිරීමේ ප්‍රමාද වීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට බැඳීම් ගාස්තු ලෙස ලං.වි.ම විසින් වර්ෂය තුළ දරන ලද රු. මිලියන 4.54 කට සමාන එ.ජ.ඩො 15,447.83ක් ඇතුළුව රු. මිලියන 185.29 කට සමාන එ.ජ.ඩො 874,035.85 ක් දරා තිබුණි. තවද, භාවිතයට නොගත් අයවැය ප්‍රතිපාදන මත දරන ලද බැඳීම් ගාස්තුව අනාර්ථික බවත්, අනාගතයේදී වියපැහැදම් නොවුණු ණය ප්‍රමාණයන් සඳහා පනවන ලද බැඳීම් ගාස්තු ලං.වි.ම අරමුදල්වලින් දැරීමට සිදුවන බවත් නිරීක්ෂණය විය. එබැවින්, එය ලංවිම සඳහා අමතර බරක් වනු ඇත. | ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදයන් විවිධ අනපේක්ෂිත සහ නොවැළැක්විය හැකි තත්වයන් නිසා සිදුවී ඇත. ව්‍යාපෘති දිගු කිරීම් ලබා දෙනු ලබන්නේ වලංගු සහ සාධාරණ හේතු මත පමණි. ඒ අනුව, මෙම කොන්දේසි යටතේ බැඳීම් ගාස්තු ගෙවීම නොවැළැක්විය හැකිය. | අරමුදල් ඵලදායී ලෙස භාවිත කිරීමට පියවර ගත යුතුය. |